# කහඳ සුමිත්‍ර පරපුර

ජී. පී. සමීර ප්‍රසංග[1]

ජන සංක්‍රමණ රටක ඉතිහාසය කෙරෙහි ආකාර කිහිපයකින් බලපෑ හැකිය. සංස්කෘතිකමය වශයෙන් ඇති වන සංකලනය ඉන් එකකි. එමගින් ඇති වන නව ප්‍රවණතා සංස්කෘතිකමය ගමන් මඟ කෙරෙහි තීරණාත්මකය. සංක්‍රමණික ජනයා මහා සංස්කෘතිය වෙත අනුගත වීමේ දී අන්‍යෝන්‍ය වශයෙන් ඇති වන හුවමාරු ඉතා වැදගත්ය. ක්‍රි. ව. 13 වන සියවසින් පසු ලක්දිව සංස්කෘතිය වෙනස් මඟකට යොමු කළ ජන සංක්‍රමණ ප්‍රවාහයක් එල්ල විය. දකුණු ඉන්දියානුවන් ඒ අතුරින් බහුලය. උතුරු ඉන්දියානුවෝ ද ඒ අතර වූහ. පසු කලෙක ලක්දිව ආගමික ශාසනික තලයෙහි මෙන්ම දේශපාලනික ක්ෂේත්‍රයේ ද ප්‍රමුඛයින් වූයේ මොවුන්ය. මෙලෙස ලක්දිවට පැමිණි ඉන්දියානු සම්භවයක් සහිත පරපුරකි කහඳ සුමිත්‍ර. එම පරපුර පිළිබඳ කියැවෙන පුස්කොළ පොත් දෙකක් දැනට පේරාදෙණි විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ වර්ගීකරණ අංක 277604 හා 277589 යටතේ ඇත. 277604 පුස්කොළ පොත කහඳ සුමිත්‍ර පරපුර පිළිබඳව කියැවෙන පූර්ණ පිටපතයි. එය 'ක' සිට 'කෲ' දක්වා වූ පත්ඉරු වලින් යුක්තය. විත්ති පොත් කිහිපයක් සමඟ ලියැ වී ඇති 277589 දරන පුස්කොළ පොතෙහි 277604 දරන පුස්කොළ පොතෙහිසඳහන් කථා ප්‍රවෘත්තිය අවස්ථා කිහිපයක් යටතේ කුඩා වෙනස්කම් සහිතව වෙන වෙන ම දක්වා තිබේ. ඒවා 'ක' සිට 'කෝ' දක්වාත් 'චෝ' සිට 'චෙ' දක්වාත් 'චෞ' සිට 'ජී' දක්වාත් පත්ඉරුවල සඳහන් කර තිබේ. 277604 පුස්කොළ පොත කහඳ සුමිත්‍ර පරපුරට අයත් පල්කුඹුරේ තෙරුන් විසින් ම සිය මෑණියන්ට පිං අනුමෝදන් කරවීම සඳහා ලියූ පුණ්‍ය පත්‍රයක විලාසය දක්වයි. අන්තර්ගතය එක සමාන වන මෙම පිටපත් දෙකෙහි දුමින්දාගමනයත් සමඟ මෙරටට පැමිණි සුමිත්‍ර අමාත්‍යවරයාගේ පරපුර පිළිබඳ විස්තර දක්වයි. දේවානම්පියතිස්ස පාලන සමයෙහි පැමිණි සුමිත්‍ර පරපුරෙහි මුල් සමාජිකයින්ගෙන් පැවතුන තවත් පිරිසක් කිත්සිරිමේඝ පාලන සමයෙහි මෙරටට පැමිණි බව දක්වයි. කුරුණෑගල පරාක්‍රමබාහු, කෝට්ටේ හය වන පරාක්‍රමබාහු, ධර්මපාල,සීතාවක රාජසිංහ කන්ද උඩරට සෙනරත් හා දෙවන රාජසිංහ රාජ්‍ය සමයන් කහඳ සුමිත්‍ර පරපුරෙහි වැදගත් සංසිද්ධි කිහිපයක් සිදුව ඇත. උඩරටට සුමිත්‍ර පරපුර සේන්දුවීම මෙමගින් නිරූපණය වුව ද මෙරට ඉතිහාසයේ වැදගත් පාලන අවධීන් යොදා ගනිමින් තම පරපුරෙහි ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු කරලීම හා නව ඓතිහාසික ප්‍රවාද නිර්මාණය කිරිම මොවුන්ගේ අරමුණ වී ඇති බව සනාථය.

**ප්‍රමුඛ පද :** කහඳ සුමිත්‍ර, ජන සංක්‍රමණ, සිංහල සංස්කෘතිය, පුණ්‍ය පත්‍ර, ඓතිහාසික ප්‍රවාද

---

1 ජී. පී. සමීර ප්‍රසංග